## 2025-06-16 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් කොටසක් සඳහා ආයෝජන යෝජනා කැඳවීම

නාගරික සංවර්ධන අධිකාරියට අයත් අංක 40, ඩී.ආර්.විජේවර්ධන මාවත, කොළඹ 10 ලිපිනයේ පිහිටි රූඩ 03 පර්චස් 13.85ක් වන ඉඩම් කොටස සඳහා ආයෝජන යෝජනා කැඳවා ඉඩම සංවර්ධනය කිරීම පිණිස සුදුසු ආයෝජකයෙකු තෝරා ගැනීමට සැලසුම් කර ඇත. ඒ අනුව, අදාළ ඉඩම් කොටසේ නාගරික සංවර්ධන රෙගුලාසිවලට අනුකූලව මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ආයෝජකයකු තෝරා ගැනීමේ අරමුණින් රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ යාවත්කාලීන තක්සේරුව මත පදනම්ව, 99 අවුරුදු බදු පදනම මත එකී ඉඩම් කොටස බැහැර කිරීම සඳහා ආයෝජන යෝජනා කැඳවීම පිණිස නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. ළමා වරදකරුවන් පුනරුත්ථාපනය සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම

නීතිය ඉදිරියේ වරදකරුවෙකු බවට පත්වන ළමයෙකුගේ අපචාරකාරී හැසිරීම හඳුනාගෙන ඔහුට/ඇයට සමාජයේ නීතිගරුක පුරවැසියෙකු ලෙසට ජීවත්වීමට ඉඩ සැලසීම ළමා පුනරුත්ථාපන ක්‍රියාවලියේ මූලික අරමුණකි. ඒ අනුව, නීතිය ඉදිරියේ වරදකරුවෙකු බවට පත්වූ ළමයෙකු සම්බන්ධයෙන් පියවර ගැනීමේදී, වරදේ ස්වභාවය අනුව සමථකරණය, අවවාද කොට නිදහස් කිරීම, කොන්දේසි සහිතව නිදහස් කිරීම, විවෘත පරිසරයේ තබා පුනරුත්ථාපනය කළ හැකි ළමා වරදකරුවන් පරිවාස භාරයට පත් කිරීම, ප්‍රජා විශෝධන සේවය යටතේ පුනරුත්ථාපනය කිරීම සහ රැඳවුම් නිවාසවල රඳවා තැබීම සිදු කරනු ලබයි. නීතිය ඉදිරියේ වරදකරුවන් වන ළමුන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ආර්ථික සහ සමාජ පසුබිම පිළිබඳව අධ්‍යයනය කොට, එවැනි ළමුන් පුනරුත්ථාපනය කිරීම පිළිගත් ජාතික ප්‍රතිපත්තියකට අනුව සිදු කළයුතු බවට හඳුනා ගනු ලැබ තිබේ. ඒ අනුව, රජය, සංවර්ධන පාර්ශ්වකරුවන් සහ එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික ළමා අරමුදල (UNICEF) යන ආයතනවල දායකත්වයෙන් "ළමා වරදකරුවන් පුනරුත්ථාපනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය" කෙටුම්පත් කිරීම පිණිස කාන්තා සහ ළමා කටයුතු ඇමතිතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

03. **ආයතනික රැකවරණය හෝ භාරකාරත්වය යටතේ වන ළමුන් සහ වීදි ළමුන් සඳහා ජීවන වියදම් දීමනාවක් ලබා දීමේ වැඩසටහන**

දෙමාපියන් අහිමි වීම, භාරකාරිත්වය අහිමි වීම, මව සහ පියා යන දෙදෙනාම හෝ ඉන් එක් අයෙකුගේ හෝ භාරකාරිත්වය යටතේ සිටියද, ජීවත් වන නිවස තුළ නිසි රැකවරණය සහ ආරක්ෂාව නොමැති දරුවන්ට මෙන්ම අනාථ හා අතහරිනු ලැබූ දරුවන්ට රඳවුම් නිවාස/ළමා සංවර්ධන මධ්‍යස්ථාන තුළ ආයතනික රැකවරණය ලබා දෙනු ලබයි. 2024 වර්ෂය අවසාන වන විට රජය, ස්වේච්ඡා සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන මගින් රට පුරා පවත්වාගෙන යනු ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථාන 356ක ළමුන් 9,191ක් පමණ නේවාසිකව රැකවරණය ලබමින් සිටින බව වාර්තා වී ඇත. ආයතනික රැකවරණය හා භාරකාරිත්වයේ සිටින ළමුන් සහ වීදි ළමුන් සඳහා මාසිකව රුපියල් 5,000/-ක දීමනාවක් ලබා දීම සඳහා රුපියල් මිලියන 1,000ක ප්‍රතිපාදන 2025 වර්ෂය සඳහා වන අයවැය මගින් වෙන් කරනු ලැබ ඇත. ඒ අනුව, යෝජිත ජීවන වියදම් දීමනාව පහත සඳහන් පරිදි ගෙවීමටත්, එම වැඩසටහන තිරසරව හා ඵලදායීව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මග පෙන්වීම සහ පසුවිපරම් කටයුතු සඳහා කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ සභාපතිත්වයෙන් සහ අනෙකුත් අදාළ ආයතනවල නිලධාරීන්ගෙන් සමන්විත ජාතික මෙහෙයුම් කමිටුවක් පත් කිරීමටත් කාන්තා සහ ළමා කටයුතු ඇමතිතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* රුපියල් 5,000/-ක ජීවන වියදම් දීමනාවෙන් රුපියල් 3,000/-ක් භාරකාරිත්වය යටතේ සැලසිය යුතු අධ්‍යාපන, සෞඛ්‍ය සහ අනෙකුත් සුබසාධන වියදම් වෙනුවෙන් ළමයා රැඳී සිටින සංවර්ධන මධ්‍යස්ථානයට හෝ භාරකාරිත්වය දරන්නාට ජාතික ඉතිරිකිරීමේ බැංකුව හරහා ලබා දීම.

* ඉතිරි රුපියල් 2,000/-ක මුදල දරුවාගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ දරුවාගේ නමින් වූ ඉතිරි කිරීමේ ගිණුමක මාසිකව තැන්පත් කිරීම.

04. **සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ (GEM) ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුව වෙතින් අතිරේක මූල්‍ය පහසුකම් ලබා ගැනීම**

ලෝක බැංකුව විසින් සපයන ලද ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක අරමුදල් යටතේ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ (GEM) ව්‍යාපෘතිය 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වෙමින් පවතී. මෙ වන විට එම ව්‍යාපෘතිය යටතේ හඳුනාගන්නා ලද ව්‍යාපෘති සංරචක සියල්ලම පාහේ ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර

ගනු ලැබ ඇත. එම ව්‍යාපෘතිය යටතේ හඳුනාගනු ලැබ ඇති තවත් සංරචක කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් ව්‍යාපෘති යටතේ ඉතිරිව පවතින අරමුදල්වලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක අතිරේක මූල්‍ය පහසුකමක් සලසා ගැනීමට හැකියාව පවතින බව පෙනී ගොස් ඇත. 2026 වර්ෂයේදී ආරම්භ කෙරෙන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අදාළව පාසල්වල ඩිජිටල් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, සියලුම පළාත්වල තෝරාගත් පාසල් 900ක සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම, ප්‍රතිසංස්කරණය කරන ලද විෂය මාලා ඇගයීම්කරණය සහ ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස එකී අතිරේක මූල්‍ය පහසුකම යෙදවීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, යෝජිත අතිරේක මූල්‍යකරණය ලබා ගැනීම පිණිස ලෝක බැංකුව සමඟ සාකච්ඡා සම්මුති පැවැත්වීම සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. කැලණි ගංගා ද්‍රෝණිය සඳහා ජලාධාර කළමනාකරණ සැලැස්ම සකස් කිරීම

කැලණි ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ජල පෝෂක ප්‍රදේශ මේ වනවිට දරුණු ලෙස ඛාදනය, පහළ නිම්නවල අවසාදිත තැන්පත් වීම, වැලි ගොඩ දැමීම, භූමි පරිහරණ රටාවන් වෙනස් වීම, නාගරීකරණය, කාර්මීකරණය, ජල පෝෂක ප්‍රදේශ දූෂණය සහ ජල ගුණාත්මකභාවය පිරිහීම ආදී සාධක හේතුවෙන් විශාල පාරිසරික ගැටලුවලට මුහුණ දෙමින් සිටී. එම කරුණු සැලකිල්ලට ගනිමින්, කැලණි ගඟ සඳහා සරල හා ආන්තික උප ජලාධාර තොරතුරුවලින් සමන්විත කළමනාකරණ සැලසුම් ඇතුළත්ව ජලාධාර කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ජලපෝෂක ප්‍රදේශ නගාසිටුවීම සඳහා ඒ සම්බන්ධිත ආයතන සහ ජල පෝෂක ප්‍රදේශවල ජනතාව සමඟ එක්ව එම සැලසුම ක්‍රියාත්මක කිරීමේ හැකියාව පවතී. ඒ අනුව, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සැලකිල්ලට ගෙන, "Clean Sri Lanka" වැඩසටහන යටතේ වෙන් කර ඇති රුපියල් මිලියන 250ක ප්‍රතිපාදන යොදා ගෙන 2025 සහ 2026 වර්ෂයන් තුළ කැලණි ගංගා ද්‍රෝණිය සඳහා ජලාධාර කළමනාකරණ සැලැස්මක් සකස් කර මධ්‍යකාලීන අයවැය රාමුව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

**06. දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර ප්‍රවේශය (CResMPA) යටතේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සේවා නවීකරණය කිරීම**

ලෝක බැංකුවේ මූල්‍ය අනුග්‍රහය යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය ක්‍රියාත්මක කරමින් පවතී. නිවැරදි පූර්ව අනතුරු ඇඟවීම් හරහා ස්වභාවික විපත් මඟින් විය හැකි හානි අවම කර ගැනීම තුළින් ජාතික සංවර්ධනයට සහාය වීම, දේශගුණය ආශ්‍රිත ආපදා අවදානම් අවම කිරීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාලගුණය සහ දේශගුණය ආශ්‍රිත සේවා නවීකරණය කිරීම, එම ව්‍යාපෘතියේ පළමු අදියරෙහි සංරචක 1 යටතේ ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සේවා නවීකරණ කටයුතු සිදු කිරීම සඳහා උපදේශන ආයතනයක් තෝරා ගැනීම සඳහා ලෝක බැංකු ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කරමින් අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවා තිබේ. ඒ සඳහා ආයතන 08ක් විසින් අභිලාෂ ප්‍රකාශ කිරීම් ඉදිරිපත් කර ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශන ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව, තායිලන්තයේ බැංකොක්හි ආසියානු ආපදා සූදානම සඳහා වූ මධ්‍යස්ථානය (Asian Disaster Preparedness Centre) වෙත අදාළ උපදේශන සේවා කොන්ත්‍රාත්තුව පිරිනැමීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. තෝරාගත් ප්‍රධාන වැව්වලට අයත් සීමාවන් සහ සංරක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීමේ වැඩසටහන**

නාගරීකරණය, ජනාවාස ව්‍යාප්ත වීම සහ නව කර්මාන්ත ස්ථාපිත වීම වැනි නොයෙකුත් කාර්යයන් වැව් ආසන්නයේ පිහිටි ඉඩම්වල සිදු වීම හේතුවෙන් එම ප්‍රදේශවල විවිධ භූමි පරිභෝජන රටාවන් ව්‍යාප්ත වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. භූ පරිභෝජන රටාවන් වෙනස්වීම හේතුවෙන් මේ වන විටත් විවිධ බලපෑම්වලට ලක්ව ඇති සහ එවැනි බලපෑම්වලට ලක්වීමේ නැඹුරුවක් ඇතැයි හඳුනාගත හැකි වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රධාන වැව්වල සීමාවන් ඕනෑම පුරවැසියෙකු හෝ පාර්ශ්වයකට පහසුවෙන් හඳුනා ගැනීමට හැකි වන පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මායිම් කණු යොදා නිශ්චිත ලෙස භූමියේ සලකුණු කිරීම කාලීන අවශ්‍යතාවක් ලෙස හඳුනාගනු ලැබ තිබේ. ඊට අමතරව, මායිම් අතර සුදුසු ගස් වර්ග රෝපණය කර ජෛව වැටියක් සැකසීම යෝග්‍ය බව ද වැඩිදුරටත් හඳුනා ගනු ලැබ ඇත. මෙම කාර්යය සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්, ගොවි සංවිධාන, පරිසර සංවිධාන, සමාජ සංවිධාන සහ පාසල්

දරුවන් සුදුසු පරිදි සහභාගි කර ගැනීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, "Clean Sri Lanka" වැඩසටහන යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයට ලබා දී ඇති රුපියල් මිලියන 100ක ප්‍රතිපාදන යොදා ගනිමින්, යෝජිත වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. නැගෙනහිර බහාලුම් පර්යන්තයේ (ECT) සහ ජය බහාලුම් පර්යන්තයේ (JCT) බහාලුම් මෙහෙයුම් සඳහා ගැන්ට්‍රි දොඹකර 07ක් ප්‍රසම්පාදනය කිරීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැගෙනහිර බහාලුම් පර්යන්තයේ සහ ජය බහාලුම් පර්යන්තයේ බහාලුම් මෙහෙයුම් සඳහා රබර් ටයර් සවිකළ විදුලි බලයෙන් ක්‍රියාකරවන ගැන්ට්‍රි දොඹකර 07ක් ප්‍රසම්පාදනය කිරීමට 2025 වර්ෂයේ අයවැය යටතේ එම අධිකාරිය විසින් ප්‍රතිපාදන සලසා ගනු ලැබ ඇත. ඒ අනුව, ජාත්‍යන්තර තරගකාරී ලංසු ක්‍රමවේදය අනුගමනය කරමින් ගැන්ට්‍රි දොඹකර 07ක් ප්‍රසම්පාදනය කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සඳහා ප්‍රයිම් මූවර් රථ 20ක් ප්‍රසම්පාදනය කිරීම**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පර්යන්ත තුළ බහාලුම් මෙහෙයුම් සිදු කිරීමට හා වරාය පරිශ්‍රය තුළ අන්තර් පර්යන්ත ප්‍රවාහන කටයුතු සඳහා ඩීසල් බලයෙන් ක්‍රියා කරන ප්‍රයිම් මූවර් රථ හා පර්යන්ත ට්‍රැක්ටර් 119ක් භාවිත කරනු ලබයි. ඒ අතුරින් රථ 60ක් වසර 20කට වඩා පැරණි වන අතර, නිතර අලුත්වැඩියා කළ යුතුව ඇත. එම තත්ත්වය සලකා බලා පර්යන්ත ට්‍රැක්ටර් රථ 20ක් මිල දී ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය 2023 වසරේදී තීරණය කරනු ලැබ ඇති අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා දී තිබේ. ඉන් අනතුරුව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ යාවත්කාලීන අවශ්‍යතාවට අනුව, පෙර යෝජනා කරන ලද ඩීසල් භාවිතයෙන් ක්‍රියාකරන පර්යන්ත ට්‍රැක්ටර් වෙනුවට විදුලි බලයෙන් ක්‍රියා කරන ප්‍රයිම් මූවර් රථ 20ක් මිල දී ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රුපියල් මිලියන 1,000ක් එම අධිකාරියේ 2025/2026 ප්‍රාග්ධන අයවැය යටතේ වෙන් කර තිබේ. ඒ අනුව, ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය යටතේ එකී ප්‍රයිම් මූවර් රථ 20 මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ (FAO) තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායමෙහි (IGG) 26 වන සැසිවාරය සහ ආසියානු තේ සන්ධානයේ (ATA) 4 වන වාර්ෂික රැස්වීම පැවැත්වීම හා තේ පර්යේෂණ ආයතනයේ ශත සංවත්සරය සැමරීම**

එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකාර්මික සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායමෙහි 26 වන සැසිවාරය, ආසියානු තේ සන්ධානයේ 4 වන වාර්ෂික රැස්වීම සහ තේ පර්යේෂණ ආයතනයේ ශත සංවත්සරය සැමරීම 2025 නොවැම්බර් මස 9 සිට 14 දක්වා කොළඹ දී පැවැත්වීම සහ ඊට අදාළව අවශ්‍ය පියවර ගැනීම සම්බන්ධයෙන් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් මෙහෙයවනු ලබන කොන්ක්‍රීට් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් කොන්ක්‍රීට් සහ ගොඩනැගිලි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබේ. යෝජිත ව්‍යාපෘතිය මඟින් කොන්ක්‍රීට් සහ ගොඩනැගිලි අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කර එමගින් නැවත භාවිතය සඳහා ලැබෙන මූලද්‍රව්‍ය, ඒ සඳහා සුදුසු නිමැවුම් වෙනුවෙන් භාවිතා කිරීමට සහ ස්වභාවික සම්පත් මඟින් සෘජුවම ලබා ගන්නා වූ අමුද්‍රව්‍ය සමඟ මිශ්‍ර කර භාවිතා කිරීමට සැලසුම් කර ඇත. යෝජිත ව්‍යාපෘතියේ යන්ත්‍රසූත්‍ර, ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ඒකල කාර්මික ජනපදයේ ඇති පෙරසවි කොන්ක්‍රීට් අංගනයේ ස්ථාපිත කිරීම සුදුසු බවට හඳුනා ගනු ලැබ තිබේ. ඒ අනුව, "Clean Sri Lanka" වැඩසටහන යටතේ සිය අමාත්‍යාංශය වෙත වෙන් කර ඇති රුපියල් මිලියන 200ක ප්‍රතිපාදන භාවිත කරමින් යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **ජාතික ලේඛනාගාරයේ විශ්වසනීය ඩිජිටල් කෝෂ්ඨාගාරයක් (Digital Repository) ස්ථාපිත කිරීම (අදියර 01)**

ජාතික ලේඛනාගාරයේ විශ්වසනීය ඩිජිටල් කෝෂ්ඨාගාරයක් ස්ථාපිත කිරීමේ අදියර - 01 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2021-04-05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. යෝජිත ව්‍යාපෘතිය මඟින් ජාතික ලේඛනාගාරයේ මූලික කාර්යභාරය වන තොරතුරු සංරක්ෂණය සහ ඒ සඳහා ප්‍රවේශ්‍යතාව ලබා දීමට අත්‍යවශ්‍ය වන මෘදුකාංග ස්ථාපිත කිරීම අපේක්ෂා කරනු

ලබයි. අන්තර්ජාතික අධිලේඛන කවුන්සිලයේ අරමුදලක් මඟින් යුරෝ 7,000ක ප්‍රදානයක් ජාතික ලේඛනාගාරය වෙත ලබා දීමට එකඟතාව පළ කර ඇති අතර, යෝජිත ව්‍යාපෘතියේ වියදමින් කොටසක් ආවරණය කර ගැනීම සඳහා එම මුදල යෙදවීමට සැලසුම් කර තිබේ. යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මඟින් ජාතික ලේඛනාගාරය විසින් මහජනතාව වෙත සලසන සේවාවන් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව සැලසීමට හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව, යෝජිත විශ්වසනීය ඩිජිටල් කෝෂ්ඨාගාරය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 2025-2027 කාලසීමාව තුළ ක්‍රියාත්මක කිරීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **රාජ්‍ය වාණිජ ව්‍යාපාර කළමනාකරණ පනත් කෙටුම්පත**

රජය සතු ව්‍යාපාරික සමාගම් මනා කළමනාකාරිත්වයක් ඇතිව හා අවශ්‍ය ප්‍රතිසංස්කරණයන් හඳුන්වා දෙමින් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය වාණිජ ව්‍යාපාර කළමනාකරණ පනත නමින් නව පනතක් හඳුන්වා දීමටත්, එකී නව පනත කෙටුම්පත් කිරීම සඳහා පිළියෙල කර තිබූ මූලික කෙටුම්පත සමාලෝචනය කරමින් යෝග්‍ය සංශෝධන ඇතුළත් කර තවදුරටත් එකී කෙටුම්පත වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල කමිටුවක් පත් කිරීමටත් 2025-04-28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. එකී අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් මූලික කෙටුම්පත සමාලෝචනය කර, සිය නිර්දේශ ඇතුළත් කමිටු වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව, එම වාර්තාවේ නිර්දේශ මත පදනම්ව, රාජ්‍ය වාණිජ ව්‍යාපාර කළමනාකරණ පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් දීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **ශ්‍රී ලංකා ගුවන්යානා හදිසි අනතුරු විමර්ශනය කිරීමේ කාර්යාංශය (AAIBSL) ස්ථාපිත කිරීම**

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතට අනුව, ශ්‍රී ලංකාවේ සීමාව ඇතුළත ගුවන් ගමන් අනතුරු සහ සිද්ධීන් පිළිබඳව විමර්ශනය කිරීමේ වගකීම එම අධිකාරිය වෙත පැවරී ඇත. එහෙත්, 2010 වර්ෂයේ දී පවත්වන ලද ජාත්‍යන්තර ගුවන් සේවා සංවිධානයේ (ICAO) නිරුපද්‍රිතතා අධීක්ෂණ විගණනයක දී ගුවන් යානා හදිසි අනතුරු සහ සිදුවීම් සම්බන්ධයෙන් විමර්ශන කිරීම සඳහා ස්වාධීන ක්‍රියාවලියක් නොමැති වීම පිළිබඳව කරුණු අනාවරණ කර තිබේ. ඒ අනුව, ස්වාධීන ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා ගුවන් යානා හදිසි අනතුරු විමර්ශනය කිරීමේ කාර්යාංශයක් පිහිටුවීම පිණිස 2016 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල

අනුමැතිය ලබා දී ඇති අතර, මේ වන විට ඒ සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් පනත් කෙටුම්පතක් සකස් කරනු ලැබ ඇත. එකී පනත් කෙටුම්පත සඳහා තවදුරටත් විධිවිධාන කිහිපයක් හඳුන්වාදිය යුතු බවට අදාළ පාර්ශ්වයන් විසින් පෙන්වා දී තිබේ. ඒ අනුව, එකී විධිවිධාන ද ඇතුළත් කරමින් අදාළ පනත් කෙටුම්පත සකස් කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**15. 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම**

2024 මධ්‍ය වාර්ෂික ජනගහන ඇස්තමේන්තුවට අනුව ශ්‍රී ලංකාවේ වැඩිහිටි ප්‍රජාව මිලියන 2.7 ක් පමණ වේ. වර්ෂ 2052 වන විට ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 60 හෝ ඊට වැඩි වයස්ගත ජනගහනය 24.8% දක්වා ඉහළ යනු ඇති බවට එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කටයුතු දෙපාර්තමේන්තුව විසින් පුරෝකථනය කර ඇත. එබැවින්, "සෞභාග්‍යයේ දැක්ම" නොව "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යන රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ "ගෞරවනීය ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් - අර්ථවත් විශ්‍රාම දිවියක්" යන අරමුණ සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි වයස්ගත වන වැඩිහිටියන්ට සමාජමය, ආර්ථිකමය, ශාරීරික සහ අධ්‍යාත්මික වශයෙන් තෘප්තිමත් ජීවිතයක් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම කෙරෙහි රජය විශේෂ අවධානය යොමු කර තිබේ. ඒ සඳහා 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත කාලීන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. ඒ අනුව, එකී පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**16. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත, 2016 අංක 17 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතින් අවසන් වරට සංශෝධනය කර ඇති අතර විවිධ පරිපාලන තනතුරු සඳහා පුද්ගලයින් තෝරා ගැනීමේ දී සහ පත් කිරීමේ දී පනතේ ඇතැම් විධිවිධානවල පවතින අපැහැදිලිතා හේතුවෙන් ගැටලු පැන නගින බව නිරීක්ෂණය වී ඇත. ඒ අනුව, එම පනතේ 49වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ පීඨාධිපති තනතුරට පත් වීම සඳහා යෝජිත සුදුසුකම් සහ පනතේ 51වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ අධ්‍යයන අංශ ප්‍රධානියෙකු ලෙස පත් කිරීම සඳහා වන සුදුසුකම් සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, එකී පනත

සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**17. අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රයෙහි (අමරදේව අසපුව) ඉදිරි ඉදිකිරීම් කටයුතු සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීම**

අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය (අමරදේව අසපුව) ඉදිකිරීම සඳහා බත්තරමුල්ල අපේගම පරිශ්‍රයේ පර්චස් 100ක ඉඩම් කොටසක් වෙන් කර දී තිබේ. අමරදේව අසපුවේ දෙවන අදියරේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා රුපියල් මිලියන 21.745ක් ද අවසන් අදියරේ වැඩ අවසන් කිරීම සඳහා තවත් රුපියල් මිලියන 179.436ක් ද අවශ්‍ය බවට උපදේශන ආයතනය වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇත. එමෙන්ම, වැඩ අවසන් කිරීමෙන් පසු කාර්යාල කටයුතු පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීම පිණිස තවත් රුපියල් මිලියන 20ක් පමණ අවශ්‍ය බවත් පෙන්වා දී ඇත. ඒ අනුව, අමරදේව අසපුවේ ඉදිකිරීම් කටයුතු අවසන් කර එහි කාර්යාල කටයුතු පවත්වාගෙන යාමට හැකි වන පරිදි අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**18. 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත සහ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත පරිච්ඡින්න කිරීම**

වත්මන් රජය විසින් මහජනතාව වෙත ඉදිරිපත් කරන ලද "සෞභාග්‍යයේ රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව, හිටපු ජනාධිපතිවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ලබා දී ඇති විශේෂ වරප්‍රසාද අහෝසි කිරීම සඳහා සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වසර 05කට පසු ලබා දෙන විශ්‍රාම වැටුප අහෝසි කිරීම සඳහා ජනතාව විසින් රජයට වරමක් ලබා දී තිබේ. ඒ අනුව, හිටපු ජනාධිපතිවරුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ලබා දී ඇති විශේෂ වරප්‍රසාද අහෝසි කිරීමට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අහෝසි කිරීමට හැකි වන පරිදි 1986 අංක 4 දරන ජනාධිපතිවරයන්ගේ හිමිකම් පනත සහ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත පරිච්ඡින්න කිරීම සඳහා පනත් කෙටුම්පත් 02ක් සකස් කිරීම පිණිස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 19. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන විශේෂ ස්ථාවර තැන්පතු යෝජනා ක්‍රමය

2025 වර්ෂය සඳහා වන අයවැය කථාවෙහි යෝජිත පරිදි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා විශේෂ ස්ථාවර තැන්පතු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට රජය විසින් තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, පහත සඳහන් පරිදි යෝජිත විශේෂ ස්ථාවර තැන්පතු ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* වයස අවුරුදු 60 හෝ ඊට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් 2025-07-01 දින සිට 2025-12-31 දින දක්වා වන කාලසීමාව තුළ විවෘත කරනු ලබන ස්ථාවර තැන්පතු සඳහා මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

* ස්ථාවර තැන්පතුවේ කාලසීමාව මාස 12ක් (වර්ෂයක්) වන අතර, උපරිම තැන්පතු වටිනාකම රුපියල් මිලියනයකි.

* බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු පොලී අනුපාතයට (AWFDR) අමතර වාර්ෂික 3%ක් එකතු කර ලැබෙන අගය හෝ අදාළ බැංකුවේ ප්‍රකාශිත ස්ථාවර තැන්පතු පොලී අනුපාතයට 3%ක් එකතු කර ලැබෙන අගය හෝ යන දෙකෙන් ඉහළ පොලී අනුපාතය ගෙවීම.

* සමස්ත වැඩසටහන සඳහා පොලී සහනාධාර ගෙවීම පිණිස රුපියල් බිලියන 30ක ප්‍රතිපාදන වෙන් කිරීම.

**********